" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

Chief Secretary } Telephone - 011 - 2092599 / Fax - 011 - 2092601 / E-mail - chiefsecretary@wpc.gov.lk
General Telephone } 011 - 2093000

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

My No } CSWP/PTR/2-4/FI/6(E)   Your No. }   Date } 2023.01. [illegible]

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය.

ප්‍රධාන ලේකම්,
වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර/සබරගමුව/ඌව/මධ්‍යම/දකුණු, පළාත

ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**<u>බස්නාහිර පළාත් අධ්‍යාපන ,සංස්කෘතික හා කලා කටයුතු,ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීම.</u>**

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති, කාර්යාලවල පහත සඳහන් අයුරින් පුරප්පාඩු පවතින තනතුරු සඳහා **සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අනු අංකය | තනතුර | ආයතනය | අනුමත ශ්‍රේණිය |
|---|---|---|---|
| 01 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය - හෝමාගම | I ශ්‍රේණිය |
| 02 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ | කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ | I ශ්‍රේණිය |
| 03. | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන හා සැලසුම්) | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | I ශ්‍රේණිය |
| 04. | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | I ශ්‍රේණිය |

02. <u>I ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුසුකම් -</u>

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකුවීම.

- අයදුම්කරු මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2023.01.20 දිනට පූර්වාසන්න වසර 05 තුළදී කිසිඳු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, එම වසර 05 තුළදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

- ❖ සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

03. තෝරාගනු ලබන ක්‍රමවේදය -

ඉහත 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙන අතර, එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. (අයදුම්පත්‍රය හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

04. නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

05. ඒ අනුව, මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හි සේවය කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සුදුසුකම්ලත් නිලධාරීන් දැනුවත් කර, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2023.01.20 දින හෝ ඊට පෙර applicationptr@gmail.com** දරණ විද්‍යුත් ලිපිනය වෙත යොමු කර, එහි දෘඩ පිටපතක් **2023.01.23 දිනට හෝ ඊට පෙර** " ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (බස්නාහිර පළාත් සභාව), අංක. 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට SPEED POST/ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට කටයුතු කරන ලෙස ද දැනුවත් කරන්නේ නම් මැනවි.

06. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතුවේ.

07. එසේම, යම් නිලධාරියෙකු උක්ත තනතුරක් සඳහා තෝරාගනු ලැබුව හොත් එම නිලධාරියා අදාළ පරිපාලන බලධාරියා වෙතින් බස්නාහිර පළාත් සභාව වෙත නිදහස් කරවා ගැනීමට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ට මැදිහත් විය නොහැකි බවද සැලකුව මැනවි.

**ප්‍රදීප් යසරත්න**
**ප්‍රධාන ලේකම්**
**බස්නාහිර පළාත**